**ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගම - 2020**

**---------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------------------**

ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 09 ක කාලය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය රදවාගත් ඉපයුම් පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 09 ක කාලය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 09 ක කාලය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 09 ක කාලය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) විවිධ ව්‍යාපෘති යටතේ **2008 – 2015** කාල සීමාව තුල මිලදී ගෙන තිබුණු භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවති පිරිවැය **රු.10,003,442** ක් වූ යතුරු පැදි **08** ක් සහ පාපැදියක් අපහරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සමාගම සතුව විවිධ ව්‍යාපෘතීන් වල පවතින යතුරු පැදි 08 සහ පාපැදිය යන ස්ථාවර වත්කම් අතරින් යතුරු පැදි 03 ක් පමණක් වර්තමානයේ භාවිතයට ගනු ලබන අතර ඉතිරි ඒවා ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව පිළියෙල කිරීමේ දී අපහරණය කළ යුතු වත්කම් ලෙස හඳුනාගන්නා ලදී. අදාල වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය සඳහා යොමු කරන ලදි එහිදී අපහරණය කලයුතු වත්කම් තක්සේරුකරුවකු මගින් අගය කර අපහරණය කරන මෙන් අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් දෙන ලදී. ඒ අනුව රාජ්‍ය | භාවිතයට ගත නොහැකි වත්කම් ඉක්මනින් තක්සේරු කර අපහරණය කිරීමට කටයුතු කළ යුතුය . |

| | | | |
|---|---|---|---|
| | | තක්සේරුකරුවෙකුගේ සේවය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු වෙත ඉල්ලීම් සිදු කළද ඒ සඳහා මේ වන තෙක් ප්‍රතිචාරයක් නොලැබිණි | |
| **(ආ)** | **කන්තලේ වැලි ව්‍යාපෘතියේ වැලි කැණීම් වලින් ලද ආදායම රු.29,280,420 ක් වූ අතර එම ආදායමෙන් මහවැලි ගඟේ ආරක්ෂක වේලි 3 ක් ඉදිකිරීම සඳහා දරන ලද වියදම රු.33,799,796 ක් විය. උක්ත ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් ගිණුම්වල වෙන වෙනම දක්වනවා වෙනුවට "පුනරුත්ථාපන කන්තලේ" නමින් පාලන ගිණුමක ගිණුම්ගත කර තිබුණි. වැලි විකිණීමෙන් මෙම පුනරුත්ථාපන කටයුත්ත සඳහා ලැබුණු ආදායම ඉක්මවා සමාගම විසින් පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් දරන ලද වියදම වූ රු.4,519,376 ක් ලැබිය යුතු අත්තිකාරමක් ලෙස දක්වා තිබුණි.** | කන්තලේ සූරියපුර ප්‍රදේශයේ මහවැලි ගඟේ ආරක්ෂණ වේලි ඉදිකිරීම කන්තලේ ව්‍යාපෘතිය ආරම්භයේ ඇති කරගත් මූලික එකඟතාවයක් මත සිදු කරන ලද්දක් වන අතර ව්‍යාපෘතිය ආරම්භයේදීම වේල්ල ඉදිකිරීමේ කාර්යය සඳහා සෑම වැලි කියුබයකින්ම මුදලක් පුනරුත්ථාපන කටයුතු සඳහා වන වෙන් කරන ලදි වේල්ල සැකසීමේ ගෙවීම් අදාල පාර්ශව වෙත සිදු කිරීමේ දී ගිණුම් ශේෂයෙන් අඩු කර දක්වන ලදී. විගණන වාර්තාවෙහි සඳහන් පරිදි මෙය වැලි කැණීම් වලින් ලද ආදායමක් නොවන අතර, අනෙකුත් සෑම ව්‍යාපෘතියකම පාහේ ඇතුලත් වන මහවැලි අධිකාරිය සඳහා වන ගෙවීම්, රාජ්‍ය භාගය ගෙවීම්, වනජීවී දෙපාර්තමේන්තුවට කරනු ලබන ගෙවීම් සහ පැටවුම්කරුවන්ගේ ගෙවීම් යන වගකීම් ගිණුම් හා සමානව මෙම ගිණුම පවත්වාගෙන යනු ලැබේ. එම අරමුදලෙහි 2020 දෙසැම්බර් 31 දිනට රු.4,519,376 ක හර ශේෂය ලැබිය යුතු අත්තිකාරම් ගිණුමෙහි පෙන්වුව ද කන්තලේ වැලි ව්‍යාපෘතියෙහි සියළු වැලි තොග විකුණා අවසානයේදී අදාළ මුදල ආවරණය කර ගැනීමේ හැකියාව පවතී. | **ආදායම් හා වියදම් වෙන් වෙන්ව ගිණුම්වල දැක්විය යුතු අතර ආදායමට වඩා වියදම් කිරීමට කටයුතු නොකල යුතුය .** |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| **ණය ශේෂ** | **153,165** | **වැලි ව්‍යාපෘති 03 ක් සඳහා වර්ෂ 03-05 අතර කාලයක සිට ගෙවිය යුතු ණය ශේෂ රු.153,165 ක් ලෙස දැක්වෙන අතර ඊට අදාල ලිඛිත සාක්ෂි නොතිබුණි.** | **මේ පිළිබඳ පරීක්ෂා කර ඉදිරි කටයුතු කරනු ලැබේ .** | **ගෙවිය යුතු ණය ශේෂ සඳහා ලිඛිත සාක්ෂි නිසි ලෙස පවත්වා ගත යුතුය .** |

**1.6** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනෙකුත් ලැබිය යුතු දෑ අතර යාන්ඔය ව්‍යාපෘති කාර්යාලය සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නේවාසික ගොඩනැගිල්ල මානව සම්පත් අවශ්‍යතාව සහ පුහුණු වීම් සම්බන්ධව ඇගයීමක් සිදුකල උපදේශකවරයකු සඳහා සමාගම විසින් 2018 වර්ෂයේ ගෙවා තිබූ රු.550,000 ක මුදල කාර්යාංශයෙන් ප්‍රතිපූරණය කර නොතිබුණි. | යාන්ඔය වැලි ව්‍යාපෘති භූමියේ කාර්යාල හා නේවාසික ගොඩනැගිල්ල සම්බන්ධව සහ මානව සම්පත ඇගයීමට අදාලව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් සමාගම වෙත පිළිවෙලින් ලැබිය යුතු රු.150,000 හා රු.400,000 ක් විය. එම මුදල අයකර ගැනිම සඳහා ඊට අදාල සියලු ලේඛනවල පිටපත් ඇතුළත් ලිපියක් 2020 අගෝස්තු 10 දින කාර්යාංශය වෙත යවන ලදි. | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත කුලී පදනම මත සපයා තිබූ සේවකයන් වෙත ගෙවා තිබුණු රු 24,988. ක මුදල අයකරගෙන නොතිබූ අතර බොල්ණය ලෙස කපා හැරීමට සමාගම පියවර ගෙන තිබුණි. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලැබිය යුතුව තිබූ රු.24,987.78 ක මුදල බොල්ණය වශයෙන් කපා හැරීම අධ්‍යක්ෂ මන්ඩල අනුමැතිය යටතේ සිදුවිය. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත කුලී පදනම මත සපයා තිබූ සේවකයන් වෙත අප සමාගම විසින් ගෙවන ලද මුදල් ප්‍රතිපූර්ණය කර ගැනිමේ මතු වූ ගැටලුකාරි තත්ත්වය මත අදාල මුදල අයකර ගැනිමට නොහැකි විය. කාර්යාංශය වෙතින් එවන ලද විස්තරාත්මක වාර්තාවේ කරුණු දැක්විමට අනුව ක්ෂේත්‍ර සහකාර තනතුරට අතිකාල හිමිකම නොමැති විම හා ඇතැම් අවස්ථාවල වැඩිපුර අතිකාල ගෙවීම ගමන් හා සංයුක්ත දීමනා වලට අදාල දිනයන් පැහැදිලි නොවීම යන කරුණු මත අදාල මුදල ඔවුන් විසින් ගෙවා නොමැතිව තිබුණි. | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**1.6.2** අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2015-2018** කාලය තුළ සමාගමේ නිලධාරීන් **03** දෙනෙකු වෙත ගෙවන ලද රු.**198,970** ක අත්තිකාරම්ද තවත් නිලධාරීන් **05** දෙනෙකුට **2018-2019** කාලය තුළ ගෙවූ රු.**1,050,695** ක මිලදී ගැනීමේ අත්තිකාරම් ද නිරවුල් කර නොතිබුණි. | විගණන වාර්තාවේ දක්වා ඇති අත්තිකාරම් නිරවුල් කිරීම සම්බන්ධයෙන් අදාල පාර්ශව වෙත අවස්ථා කිහිපයකදීම සිහි කැඳවීමේ ලිපි යවා ඇත. | අත්තිකාරකම් නොපමාව පියවා ගැනිමට පියවර ගත යුතුය . |

**1.7** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **19** අංක **2018** දරන ජාතික විගණන පනතේ වගන්තිය **40** | සමාගම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ මාස 09 ක කාලය තුල අභ්‍යන්තර විගණන සැලැස්මක්ද සකස් කර නොතිබුණි. | පසුගිය වසර 02 කට ආසන්න කාලයක් තුල සමාගම තුල අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාකාරිව නොපැවතිම හේතුවෙන් ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම ඵලදායීව ක්‍රියාවට නැංවීමට අවශ්‍ය විගණන සැලැස්මක් පිළියෙල කිරීමක් සිදු නොවුණි.<br>එසේ නමුත් මේ වන විට විගණන අංශය නැවත ස්ථාපිත කර ඇති බැවින් විගණන සැලැස්මක් පිළියෙල කිරීමේ කටයුතු මේ වනවිටත් සිදුවෙමින් පවතින බවත්, විගණන අංශයෙහි අනෙකුත් කටයුතුද කාර්යක්ෂමව සිදුවෙමින් පවතින බවත් දන්වා සිටිමි. | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) **02** ජුනි **2003** දිනැති අංක **PED/12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) **5.1.2** ඡේදය | සමාගම විසින් සකස් කර තිබූ සංයුක්ත සැලැස්මේ, ආයතනයේ දැනට පවතින සම්පත්, සංවිධාන ව්‍යුහය හා සැලසුම් කාලය තුල ළඟා | 2019-2023 වර්ෂ සඳහා වූ පස් අවුරුදු සැලැස්මක් ලෙස සංයුක්ත සැලැස්ම 2018 වර්ෂයේ දී පිළියෙල කරන ලද අතර, දැනට ආයතනය සතුව ඉඩම් හා | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය . |

| | | | |
|---|---|---|---|
| | **කරගත යුතු අරමුණු ඉලක්ක සහ වගකීම් පැහැදිලිව ඇතුලත් කර නොතිබුණි .** | නිශ්පාදන ගොඩනැගිලි කිසිවක් නොපවතින බැවින් එය සංයුක්ත සැලැස්මට ඇතුලත් කර නොමැත. මේ වනවිටත් ආයතනය සඳහා අනුමැතිය ලද ආයතනික ව්‍යුහයක් නොමැති අතර දැනට ආයතනයේ පවතින ආයතනික ව්‍යුහය අනුමැතිය ලබා ගැනීම සඳහා අදාල ආයතන වෙත යොමු කර ඇත. | |
| **(ii) 5.2.3 ඡේදය** | **සමාගම විසින් ගිණුම් කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කල සංශෝධිත අයවැය ලේඛනයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ 2021 ජනවාරි 25 දිනදීය.** | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 09 ක කාලපරිච්ඡේදය සඳහා වන සංශෝධිත අයවැය ලේඛණයක් අප විසින් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලදී. එදින අදාළ ලේඛණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණද රැස්වීම් වාර්තාවෙහි එය නිවැරදිව අර්ථකථනය නොවීම 2021 ජනවාරි 25 දිනට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව මගින් නිවැරදි කර දක්වා ඇත. | **-එම-** |
| **(iii) 8.3.9 ඡේදය** | **සමාගම වෙත බඳවා ගන්නා ලද සේවකයින් දෙදෙනෙකු දින 10 සැප්තැම්බර් 2020 සිට පරිසර අමාත්‍යාංශයට අනුයුක්ත කර රු 283,240.ක වැටුප් හා දීමනා සමාගමෙන් ගෙවා තිබුණි.** | අප සමාගම අපගේ සේවා පුළුල් පරාසයක් තුල ප්‍රචාරණය කරගැනීමට උත්සාහ දරන ආයතනයක් වශයෙන් මෙන්ම තාක්‍ෂණික සේවා සැපයුම් ආයතනයක් වශයෙන්, අප සමාගමෙහි සේවාලාභීන් අතුරින් වැඩි පිරිසක් අපගේ සේවාව පිළිබඳ දැනුවත් වීම සඳහා ප්‍රධානතම ක්‍රමවේදය ලෙස අමාත්‍යංශයේ මැදිහත් වීම හඳුනාගෙන ඇත. එබැවින් අමාත්‍යාංශය සමඟ නිරන්තර සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා සමඟ නිරන්තර සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් සමාගමට පැවතුණි ඒ අනුව මෙම නිලධාරීන් දෙදෙනාගේ සහාය ලබා ගැනීමට එලෙෂ | **-එම-** |

| | | | | |
|---|---|---|---|---|
| | | | අනුයුක්ත කරන ලදි විශේෂයෙන්ම කොටිකම්බොක්ක තිරුවානා කැණීම් ව්‍යාපෘතිය, බලංගොඩ කැල්සයිට් ව්‍යාපෘතිය සහ ජනාධිපති කාර්ය සාධක බලකායේ නිර්දේශ මත ක්‍රියාත්මක වන වැලි බෙදා හැරීමේ ව්‍යාපෘතිය වැනි කටයුතු සම්බන්ධීකරණ කාර්යයන් සඳහා මෙම පුද්ගලයන්ගේ සක්‍රීය දායකත්වයක් ලබා ගන්නා බවද දන්වනු කැමැත්තෙමි. චක්‍රලේඛය උල්ලංඝනය කිරීමක් සිදුකර නොමැති බව දන්වමි | |
| (ඇ) | **2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.2 ඡේදය** | **සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.** | 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබූ අතර 2020 ජනවාරි 31 දින අමාත්‍යාංශ වෙත යවා ඇත. | **-එම-** |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

**සමාලෝචිත මාස 09 ක කාලය තුල මෙහෙයුම් ප්‍රතිඵලය රු.43,290,584 ක පාඩුවක් වූ අතර ඊට අනුරූපීව 2020 මාර්තු 31 දිනට ලාභය රු.37,887,098 ක් විය. ඒ අනුව මාස 09 ක කාලය තුල මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.81,177,682 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මනම්පිටිය වැලි ව්‍යාපෘතියෙන් ලැබු ආදායම අඩුවීම, අරලගන්විල, බෝඅත්ත, නිදන්වල සහ වැලිකන්ද යන වැලි ව්‍යාපෘතිවලින් කිසිදු ආදායමෙන් නොලබා වියදම් පමණක් දැරීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.**

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **ව්‍යාපෘති කාර්යාලයේ තිබූ බහාලුමක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව තිබුණු වාමූ සමීකරණ පද්ධතිය කිසියම් පිරිසක් රැගෙන ගොස් තිබුණි. විගණනය විසින් 2020 සැප්තැම්බර් 10 දින සමාගම වෙත මෙම අස්ථානගත වීම** | මනම්පිටිය දෙවන අදියර ආරම්භ කිරීමේදී එම ව්‍යාපෘතියේ කටයුතු පහසු කර ගැනීම සඳහා මෙම බහාලුම් පෙට්ටිය එම ස්ථානයේ ස්ථානගත කරන ලදී. නමුත් පිවිසුම් මාර්ග ලබා ගැනීමේදී බලාපොරොත්තු වූ ස්ථානයෙන් ලබා ගැනීමට වනජීවී අමාත්‍යාංශය විසින් අවසර ලබා නොදීම සහ පෙර සැලසුම් කර තිබූ ක්‍රමවේදයට වෙනස් ක්‍රමවේදයකට | **පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව සුදුසු පියවර ගත යුතුය.** |

| | | |
|---|---|---|
| පිළිබඳව දක්වා තිබුණ ද **2021** මැයි **17** දින තෙක් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැලි නිකුත් කිරීම සිදු කිරීම හේතු කොට ගෙන දෙවන අදියර කාර්යාලීය අවශ්‍යතා සඳහා යොදා ගැනීමට නොහැකි විය.<br><br>බහාලුමක වායු සමීකරණ යන්ත්‍රයක් නොමැති වීම පිළිබඳ ලිපියක් ප්‍රධාන කාර්යාලය වෙත ලැබී නොමැති අතර මේ පිළිබඳව කරුණු සොයා බලා කටයුතු කරනු ලැබේ. | |
| **(ii)** පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක වූ පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 හා 2018 වර්ෂවල මනම්පිටිය ව්‍යාපෘතිය මගින් නිකුත් කල වැලි වෙනුවෙන් රු.1,115,576 ක් 2021 ජුනි 11 දින වන විටත් අයවීමට තිබුණි. | පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන සඳහා නිකුත් කරන ලද වැලි වෙනුවෙන් ලැබිය යුතුව තිබූ රු.3,576,208 ක වටිනාකමින් 2021 අප්‍රේල් 28 දින වන විට රු.2,460,631 ක මුදලක් ලැබී ඇත. ඉතිරි වටිනාකම අය කර ගැනීම සඳහා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සිහි කැඳවීමේ ලිපියක් යවා ඇත. | මෙම මුදල් ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය . |
| **(ආ)** ණය පියවීමේ කාලය මාස **6** ඉක්මවූ ණය ගැති ශේෂවල එකතුව රු.**34,828,901** ක් අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇතුලු අනෙකුත් ආයතන වලින් සමාගම වෙත ලැබිය යුතු, මාස 06 ක් ඉක්මවූ රු.43,561,337 ක ශේෂය අයකර ගැනීම සඳහා ඔවුන් වෙත ලිපි මාර්ගයෙන් මෙන්ම වාචිකව නිරන්තර දැනුම් දීම් සිදුකර ඇති අතර, අදාල ශේෂයන් හැකි ඉක්මනින් අයකර ගැනීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | ණය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය . |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** මනම්පිටිය වැලි ව්‍යාපෘතිය | | |
| (i) සමාගම විසින් වැලි නිකුත් කිරීමට සාධාරණ හා නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර ව්‍යාපෘතියේ කැණීම් කරන වැලි වලින් සියයට **75** ක් පොළොන්නරුව මහවැලි එක්සත් ටිපර් රථ සංගමයේ ලොරි රථ සඳහාද, සියයට **10** ක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අනෙකුත් ලොරි සඳහාද, සියයට **15** ක් දිස්ත්‍රික්කයෙන් පිටත ලොරි සඳහාද, වශයෙන් වැලි නිකුත් | 2021 වර්ෂයේ දී මනම්පිටිය ව්‍යාපෘතිය මගින් වැලි ලබා දීමේ ක්‍රමවේදය විධිමත් කර ක්‍රියාත්මක කරමින් පවතී. එහිදී සමස්ථ වැලි ප්‍රමාණයෙන් **සියයට** 15 ක් ආයතනයේ වැලි අංගන සහ ආයතන මගින් ප්‍රවාහනය සඳහා වෙන් කර ඇත**.** ඉතිරි **සියයට** 85 ක ප්‍රමාණය ටෝකන් ක්‍රමවේදය යටතේ ලබා දීමට කටයුතු කර ඇත. එසේ ටෝකන් ක්‍රමයට වැලි ලබා දීමේ දී, | වැලි නිකුත් කිරීමට අදාල නිශ්චිත ක්‍රමවේදයක් ලිඛිතව සකස් කර ගත යුතුය . |

| | | | |
|---|---|---|---|
| | **කරමින් පැවතුණි. ඊට අමතරව දේශපාලන ඉල්ලීම්, පොදු හා ආගමික කටයුතු සඳහා ඉල්ලීම් හා වෙනත් ඉල්ලීම් ඇතුලත් ප්‍රමුඛතා ලැයිස්තුව මත දිනපතා වැලි නිකුත් කිරීම් සිදුකර තිබුණි.** | 1 - පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා ලියා පදිංචි කියුබ් 03 ට වැඩි ටිපර් රථ<br>2 - පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා ලියා පදිංචි කියුබ් 03 ට අඩු ටිපර් රථ<br>3 - පොලොන්නරුව දිස්ත්‍රික්කයෙන් පිටත ලියාපදිංචි ටිපර් රථ<br>යන කාණ්ඩ 03 යටතේ වැලි ලබා ගැනීමට පැමිණෙන සියලුම ටිපර් රථ ආයතනයේ ලියාපදිංචි කර, එම ටිපර් රථ සංඛ්‍යාවට සමානුපාතික වන පරිදි සහ සියලු ටිපර් රථ සඳහා සමාන අවස්ථාවක් ලැබෙන පරිදි සියයට 85 ක ප්‍රමාණය ඉහත කාණ්ඩ 03 යටතේ වෙන වෙනම නිකුත් කරනු ලබයි. | |
| (ii) | **සමාලෝචිත වර්ෂයේදී වැලි කැණීම් ව්‍යාපෘතියේ අදියර II හි වැලි කැණීම් සිදුකර නොතිබුණි.** | මනම්පිටිය ව්‍යාපෘතියෙහි ක්‍රියාකාරීත්වයට අදාල සියලු නිර්දේශ හා මඟ පෙන්වීම් සිදු කරනු ලබන්නේ පරිසර විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකුගේ සභාපතීත්වයෙන් යුත් මනම්පිටිය පසු විපරම් කමිටුව මගින් වන අතර, එම කමිටුවෙහි සභාපති ධූරයෙන් ඉවත්වීමත් සමඟ පසුවිපරම් කමිටුවෙහි ක්‍රියාකාරීත්වය මේ වනවිට තාවකාලිකව නැවතීමක් සිදුවී ඇත. ඒ අනුව එම ධූරය සඳහා නව සභාපතිවරයකු පත්කර ගැනීම සඳහා සමාගම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් සිදුකර ඇත. අදාල පත් කිරීම සිදුකර පසුවිපරම් කමිටුව නැවත සක්‍රීය තත්වයට පත් වූ වහාම එම කමිටුවෙහි නිර්දේශ අනුව යමින් මනම්පිටිය දෙවන අදියර නැවත ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. | **පසු විපරම් කමිටුව ඉක්මනින් පත්කර නැවත ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කළ යුතුය.** |
| (iii) | **2019 වර්ෂයේ ව්‍යාපෘති කාර්යාලයේ සිදුවූ ගිනි ගැනිම සම්බන්ධ පොලිස් වාර්තාව 2020 අගෝස්තු 21 දින නිකුත් වී තිබුනි. එම වාර්තාවට අනුව මෙම ගිනි ගැනීම අහඹු ලෙස සිදුවූ සිදුවීමක් නොවන බවත් බහාලුම් පෙට්ටි වල තිබූ ලිපි ලේඛනවලට පෙට්‍රල් යොදා** | 2019 නොවැම්බර් 19 වන දින ගිනි ගැනීම සිදුවන විට එහි සේවයේ නියුතු සිවිල් ආරක්ෂක නිළධාරීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර ,එම ස්ථානයේ සවි කර තිබූ CCTV කැමරා පද්ධතිය අක්‍රිය වී පැවතියද, එය ස්ථාපනය කරන ලද සමාගමෙන් අප වෙත ලබා දී තිබූ වගකීම් කාලය නොඉක්මවා තිබූ බැවින් අප විසින් ඔවුන් වෙත | **පොලිස් වාර්තාව මගින් මෙය හිතාමතා සිදුකල ගිනිතැබීමක් බවට දැනුම් දී ඇති නිසා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීම සිදුකල යුතුය .** |

| | | | |
|---|---|---|---|
| | **හිතාමතා සිදුකර ඇති ගිනි තැබීමක් බවට වාර්තා කර තිබුණද ඒ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.** | දන්වා තිබුණේ පැමිණ එය නැවත යථා තත්ත්වයට පත් කරන ලෙසයි. නමුත් ඔවුන් පැමිණ එය නැවත යථා තත්ත්වයට පත් කිරීමට ප්‍රථම මෙම සිදුවීම සිදු විය.<br>ගිනි ගැනීම සිදු වූ දින ප්‍රධාන කාර්යාලයේ නිළධාරීන් පිරිසක් එම ස්ථානය නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව මෙය හිතාමතා සිදු කරන ලද ගිනි තැබීමක් ලෙස පෙනී යන බැවින් අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කිරීමට පොලිසියට භාර දීම සුදුසු යැයි යෝජනා **කර තිබුණි.** ඒ අනුව් සභාපතිතුමාගේ අත්සනින් යුතුව ඒ පිළිබඳව ශ්‍රී ලංකා පොලිසියෙන් ඉල්ලීමක් සිදු කළ අතර අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු නොකරන ලදී. | |
| **(ආ)** | **කන්තලේ ව්‍යාපෘතියේ වැලි ඉවත් කිරීමට සමගාමීව ක්‍රියාත්මක වන ගංවතුර ආරක්ෂණ වේලි 3 ක් ඉදිකිරීමේ වැඩ කටයුතු අධික්ෂණය සහ ගෙවීම් වාර්තා නිර්දේශය සඳහා සමාගම විසින් වේලි ඉදිකිරීම් සම්බන්ධ මනා පළපුරුද්දක් නොමැති ආධුනික ඉංජිනේරුවරයෙකු කෙටි කාලයක් සඳහා යොදවා තිබුණි. ඔහුගේ සේවා කාලය තුල කළ වැඩ පමණක් නිර්දේශ කර තිබූ අතර සේවයේ නොසිටි කාලය තුල කළ වැඩ සහතික කිරීමක් නොමැතිව රු.මිලියන 47.79 ක් ගෙවා තිබුණි. මෙම ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී නියමිත ප්‍රමිතිවලට අනුව වැඩ කටයුතු සිදුකර ඇති බවට මහවැලි අධිකාරියේ සහ වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයා ගෙවීම් ලේඛන සහතික කර නොතිබුණි.** | විශේෂ ව්‍යාපෘති කළමණාකරු විසින් සිවිල් ඉංජිනේරුවරයකු බඳවා ගැනීම සඳහා ඉල්ලීමක් කර තිබුණද එම කාල සීමාව තුල බඳවාගැනීම් සිදු නොකරන ලෙස මැතිවරණ කොමසාරිස් කාර්යාලය විසින් දැනුම් දී තිබූ බැවින් බඳවා ගැනීමක් සිදු කිරීමට නොහැකි විය. නමුත් මැතිවරණ කොමසාරිස් කාර්යාලය විසින් අවසර දුන් වහාම සිවිල් ඉංජිනේරුවරුයකු බඳවා ගත් අතර ඉන් පසුව සිදු කල සියලුම ගෙවීම් ඔහුගේ සහතිකයෙන් කරන ලදි. පැති බැම්වල ඉදිකිරීම් කටයුතු සිදුකිරීමේදී එම බැම්වල පාදම ප්‍රදේශයේ වැඩ කටයුතු නිම කිරීමෙන් පමණක් ඉහල කොටසේ වැඩ සිදු කල යුතු වේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉංපිනේරුවරුන් හා තාක්ෂණික නිළධාරීන්ගේද උපදෙස් පරිදි අපගේ ඉදිකිරීම් සිදුකරගෙන ගිය අතර ඔවුන්ගේ මැදිහත්වීම් , උපදෙස් හා මාර්ගෝපදේශයන්ට යටත්ව අපගේ මෙම සිවිල් ඉංපිනේරුවරයා ක්‍රියාකොට ඇත. කෙසේ වෙතත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉංපිනේරුවරුන්ගේ ලොග් සටහන් පාදක කරගනිමින් ගෙවීම් සිදුකර ඇත. ඉදිකිරීම්වල නිමාව සහතික කර දෙන ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා | **අදාල වගකිව යුතු ආයතනවල නිලධාරීන් නියමිත ප්‍රමිති වලට අනුව වැඩ කටයුතු සිදුකර ඇති බවට සහතික කිරීම් සිදුකල යුතුය.** |

| | | |
|---|---|---|
| | මහවැලි අධිකාරියෙන් ලිඛිත ඉල්ලීමක් සිදු කරන ලද අතර, ගෙවීම් කටයුතුද මින් ඉදිරියට එම රාජ්‍ය ආයතනයන්ගේ වැඩ සහතික කිරීම් ලද පසුව සිදු කරන බව **දන්වමි.** | |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 **වර්ෂයේදී** රු.8,883,520 **කට මිලදී ගෙන,** 2020 **දෙසැම්බර්** 31 **දිනට පොත් අගය ශූන්‍ය වී තිබූ ලෝඩර් යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා** 2019 **වර්ෂයේදී** රු.966,565 **ක් දරා තිබුණද** 2021 **ජුනි** 10 **වන දින වන විටත් එය කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකි තත්ත්වයක පැවතුණි.** | 2016 වර්ෂයේ අග භාගයේ සිට ලෝඩර් යන්ත්‍රය භාවිතයට ගැනීමට නොහැකි තත්වයේ පැවති අතර එය පසුකාලීනව හඳුනා ගැනීමෙන් අනතුරුව එහි අළුත්වැඩියා කිරීමේ හැකියාව පිළිබඳ සොයා බලන ලදී. එහිදී, යන්ත්‍රයේ ඉතිරි කොටස් අළුත්වැඩියා කිරීම සඳහා එන්ජිම පණගැන්විය යුතු බවට අළුත්වැඩියාකරු විසින් සඳහන් කිරීම හේතුවෙන් එන්ජිම අළුත්වැඩියා කරන ලදී. ඉන් පසුව ද යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.<br><br>වර්තමානය වන විට ලෝඩර් යන්ත්‍රය සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති අතර ප්‍රත්‍යාගණනය කිරීම සඳහා රාජ්‍ය තක්සේරුකරුවෙකුගේ සේවය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු වෙත ඉල්ලීම් සිදු කළද ඒ සඳහා මේ වන තෙක් ප්‍රතිචාරයක් නොලැබිණි. | **අළුත්වැඩියාව නිසි පරිදි සිදු කරවා ගැනීමට හෝ එසේ නොහැකිනම් වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය.** |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සමාලෝචිත වර්ෂයේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද, අරගලන්විල, බෝඅත්ත සහ නිදන්වල යන වැලි ව්‍යාපෘතිවල වැලි කැණීම නිසා ඇතිවූ සමාජීය, පරිසර හානි පිළිබඳව විධිමත් ඇගයීමක් කරන තෙක් මහවැලි අධිකාරිය විසින් ඉඩම් නිදහස් කිරීම් අත්හිටුවා තිබුණි. මේ කාලය තුල එම ව්‍යාපෘතිවල සේවය කල සේවකයන් වෙත සේවක වැටුප් හා අනිකුත් වියදම් ලෙස රු.8,213,347 ක් නිෂ්කාර්යව වැය කර තිබුණි.** | වැලිකන්ද, අරලගන්විල, නිදන්වල, බෝඅත්ත යන ව්‍යාපෘතීන් නැවත ආරම්භ කිරීම සඳහා 2020 වසරේදී අදාල අධිකාරීන් සමඟ සාකච්ඡා කරමින් නිරන්තර උත්සාහයන් දරන ලද නමුත් 2020 වර්ෂය අවසාන වන තෙක් ව්‍යාපෘති නැවත ආරම්භ කරන්නේද නොකරන්නේද යන්න තීරණය කර නොතිබුණි ඒ අනුව ' අදාල කාර්ය මණ්ඩලය 2020 වසර තුල රඳවා ගැනීමට ආයතනයට සිදු විය. ඒ අනුව තීරණයට එළඹි ආයතනය විසින් එම | **කළමනාකරණය මගින් ව්‍යාපෘති සම්බන්ධව කඩිනම් තීරණ ගැනීම් සිදුකල යුතුය.** |

| | | |
|---|---|---|
| | සේවකයින්ගේ කොන්ත්‍රාත් කාලය 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කරන ලදි. ආයතනය විසින් ඉහත ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කොට මහවැලි අධිකාරිය වෙතින් අනුමැතිය ලබාගත් අතර, ඒ අනුව 2021 ජුනි 01 දින සිට වැලිකන්ද, අරලගන්විල, නිදන්වල, බෝඅත්ත යන ව්‍යාපෘතීන් වල කටයුතු නැවත ආරම්භ කරන ලදි. | |
| **(ආ) කොටිකම්බොක්ක තිරුවානා ව්‍යාපෘතිය** | | |
| (i) **අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත මෙම තිරුවානා නිධිය කැණීම් කර අගය එකතු කර අපනයනය කිරිමට 2017 වර්ෂයේ සමාගමට පවරා තිබුණි. පාරිසරික බලපෑම් ඇගයීමක් (EIA) වෙනුවට නැවත මූලික පාරිසරික පරීක්ෂණයක් (IEE) සිදුකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එම මූලික පාරිසරික පරික්ෂණය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමට දීර්ඝ කාලයක් ගතවීම නිසා මෙම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.** | කොටිකම්බොක්ක තිරුවානා කැණීම් ව්‍යාපෘතිය 2016 වර්ෂයේ සමාගමට පවරා තිබූ නමුත් මෙම ව්‍යපෘතිය සඳහා අවශ්‍ය අනුමැතීන් අදාල රාජ්‍ය ආයතනවලින් නොලැබීම හේතුකොටගෙන ආරම්භ කිරීමට නොහැකිව ඇත. 2019 ඔක්තෝබර් මාසයේ පාරිසරික බලපෑම් තක්සේරුවක් සිදු කිරීම වෙනුවට මූලික පාරිසරක ඇගයීම් වාර්තාවක් සිදු කිරීම ප්‍රමාණවත් වන්නේද යන්න මධ්‍යම පරිසර අධිකාරිය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එකඟතාවයක් ලබා ගන්නා ලෙස අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණි. | **ව්‍යාපෘතිය ඉක්මනින් ආරම්භ කිරීමට පියවර ගත යුතුය.** |
| (ii) **පාරිසරික බලපෑම් ඇගයීම් සිදුකිරීම වෙනුවට මූලික පාරිසරික නිරීක්ෂණයක් සිදුකිරීම ප්‍රමාණවත් වන්නේද යන්න පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පළමුව එකගතාවයක් ලබා ගන්නා ලෙසට නැවතත් 2019 ඔක්තෝබර් 29 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණත් සමාලෝචිත වර්ෂයේ අවසාන වන තෙක් ඒ පිළිබඳ තීරණයක් ගෙන නොතිබුණි.** | ඒ වනවිටත් මෙම ව්‍යාපෘතිය සඳහා යොමු කල මූලික පාරිසරික වාර්තාවට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දී තිබුනු අතර, අමාත්‍ය මණ්ඩල උපදෙස් ප්‍රකාරව අප විසින් මේ සඳහා මූලික පාරිසරික ඇගයීම් වාර්තාවක් ප්‍රමාණවත්ද යන්න පැහැදිලි කර ගැනීම සඳහා, ලිඛිතව එම රාජ්‍ය ආයතනවලට ලිපි යොමු කර ඇත. | **අදාල ආයතන සමඟ සාකච්ඡා කර ඉක්මන් තීරණයක් ගෙන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කල යුතුය.** |
| (iii) **2017 වර්ෂයේ සිට ව්‍යාපෘතියෙන් කිසිදු ආදායමක් උපයා නොතිබූ අතර කැණීම් කරන තිරුවානා ගබඩා කිරීම සඳහා ඉඩමක් බදු ගැනීම, කැණීම් කරන තිරුවානාවල බර කිරීම සඳහා** | 2016 වර්ෂයේ අග වනවිට ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් හා කැණීම් බලපත්‍ර ලබාගෙන තිබූ අතර 2017 මාර්තු මස ලැබුණු අමාත්‍ය මණ්ඩල තීරණ | **ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.** |

| | |
|---|---|
| **පාලම් තරාදියක් මිලදී ගැනීම සහ එහි ආරක්ෂාව සඳහා ආරක්ෂාව සඳහා ආරක්ෂණ සේවකයන් යෙදවීම ඇතුළු අයහාර සහ ප්‍රාග්ධන වියදම් ලෙස 2017-2020 කාලය තුල රු.20,942,314 ක් දරා තිබුණි.** | වලට අනුගත වෙමින් නැවත කටයුතු කිරීමට සිදුවීම නිසා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රමාද වීම 2017 වනවිට ලබාගෙන තිබුණු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා සහ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය අධ්‍යයනයන් හා නිර්දේශ ලබා ගැනීම සඳහා වියදම් සිදු කර ඇත. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව රු.7,539,000 ක වටිනාකමකට මයික්‍රෝමීටර් 6 ක් මිලදී ගෙන තිබුණි.** | මෙම මයික්‍රෝමේටි යන්ත්‍රය වෙළඳපොලෙහි අලෙවිය සඳහා නිෂ්පාදකයා විසින් ලබාදෙන අයිතිය (Manufacturer authorization) සහිතව සුලභව සොයාගත හැකි ආයතන නොමැත. මෙම යන්ත්‍ර මීට පෙර අප සමාගමෙන් මිලදී ගෙන නොතිබූ අතර පළමු වරට ප්‍රසම්පාදනය කිරීම සිදුකරන ලදි. ඒ අනුව නිවැරදි පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමට අවශ්‍ය මූලාශ්‍ර සොයා ගැනීමට නොහැකි විය. කෙසේ නමුත් ප්‍රසම්පාදන කටයුතු "ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ" ක්‍රමය මඟින් සිදුකරන ලද අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යටතේ " ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ" ක්‍රමය තුල ලැබිය යුතු අවම ලංසු ප්‍රමාණයක් නිශ්චිතව දක්වා නොමැති බවද සඳහන් කර සිටිමි. | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.** |
| (ආ) | **2018 වර්ෂයේ චීනයේ නිෂ්පාදිත භූ විදුම් යන්ත්‍රයක් සඳහා අන්තර්ජාලයෙන් ලබාගන්නා ලද තොරතුරු පදනම් කරගෙන රු.4,925,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ජපානයේ නිෂ්පාදිත යන්ත්‍රයක් රු.12,873,960 කට මිලදී ගැනීමට යාමේදී, රේඛීය අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනයේ පැවති දුර්වලතා දැනුම් දීම මත එම මිලදී ගැනීම නවතා දමා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුල නැවත පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමකින් තොරව පෙර මිල ගණන් ඉදිරිපත් කළ** | මින් පෙර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී පිරිවැය ඇස්තමේන්තුව අන්තර්ජාල තොරතුරු භාවිතා කර පිළියෙල කල බැවින් වැරදි පිරිවැය ඇස්තමේන්තුවක් සකස් වීමක් සිදුවී තිබුණි. මෙලෙස අන්තර්ජාලය භාවිතා කර හෝ පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කරනු ලැබුවේ මෙම භූ විදුම් යන්ත්‍රය වෙළඳපොලෙහි අලෙවිය සඳහා නිෂ්පාදකයා විසින් ලබාදෙන අයිතිය (Manufacturer authorization) සහිතව සුලභව සොයාගත හැකි ආයතන නොමැති වීම හේතුවෙනි. කෙසේ නමුත් එම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි පැවති ගැටලු හේතුවෙන් රේඛීය අමාත්‍යාංශයේ, ප්‍රසම්පාදනයන් සඳහා අවසාන අනුමැතිය ලබාදෙන අතිරේක ලේකම්වරයාගේ අනුමැතිය මෙම පළමු ප්‍රසම්පාදනය සඳහා නොලැබුණි.<br>ඒ අනුව නැවත වරක් මිල කැඳවීම සිදු කළ අතර, එහිදී ද පිරිවැය ඇස්තමේන්තුව සැකසීමට මූලාශ්‍රයක් නොමැති වීම හේතුවෙන් " ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ" ක්‍රමය මඟින් මිල කැඳවීම සිදුකරන ලදි.<br>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති පරිදි, යම් කිසි ප්‍රසම්පාදනයක් බැහැර | **-එම-** |

| | | | |
|---|---|---|---|
| | **සැපයුම්කරුගෙන්ම රු.9,733,650 කට ජර්මනියේ නිෂ්පාදිත උපකරණයක් මිලදීගෙන තිබුණි. මෙම සැපයුම්කරු පිළිබඳවව වෙබ් අඩවි තොරතුරු පරීක්ෂා කිරීමේදී ප්‍රමාණවත් තොරතුරු දක්නට නොතිබුණු අතරම මුල් පිරිවැය ඇස්තමේන්තුව සහ මිලදීගත් වටිනාකම අතර රු.4,808,650 වෙනසක් පැවතුණි.** | කිරීමක් සිදුකල අවස්ථාවක පෙර ප්‍රසම්පාදනය සඳහා භාවිතා කරන ලද ලංසු ලේඛනයෙහි තොරතුරු වෙනස් කර නැවත මිල කැඳවීම සිදුකල යුතු බැවින් ඒ අනුව කටයුතු කරන ලද අතර, අපගේ අවශ්‍යතාවය මත අදාල යන්ත්‍රය සඳහා වන ප්‍රසම්පාදනයට සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති හා ප්‍රසම්පාදනය ඇගයීමේ දී අදාල යන්ත්‍රය සඳහා අපේක්ෂිත නිර්නායකයන් සපුරා තිබූ ආයතනය තෝරා ගන්නා ලදි නිෂ්පාදිත රට පිළිබඳ විශේෂයෙන් සලකා බැලීමක් අදාල නිර්නායකයන් තුලට ඇතුලත් කර නොතිබුණි. එසේම මෙම ලංසුව සමඟ ඉදිරිපත් කිරීමට දන්වා තිබූ සියලුම ගොනු අදාල සමාගම මඟින් ඉදිරිපත් කර තිබූ බැවින් වෙබ් අඩවිය පරිශීලනය කිරීමට අවශ්‍ය නොවීය. | |
| (ඇ) | **2020 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.10,512,342 ක් වූ බෝල්හෝල් විදුම් යන්ත්‍රයක් හා එහි උපාංග මිලදී ගැනීමේදී 2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1, 4.3.1 හා 3.2.2 ඡේද අනුව කටයුතු කර නොතිබුණි.** | සමාගමෙහි තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා පත්කරනු ලබනුයේ ඉංජිනේරු/භූ විද්‍යාඥ යන අංශයන්හී නිළධාරීන්ය. විවිධ ව්‍යාපෘති සඳහා සේවයේ හදිසි අවශ්‍යතාවයන් අනුව එම නිළධාරීන් ආයතනය තුල රැදෙන අවස්ථාවන් ඉතාමත් සීමිතය. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන කාල රාමුවට අනුව රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව කාරුණිකව දැනුම් දෙමි.<br><br>එසේම ඉහත 2.2.4 හි අ) සහ ආ) යටතේ දක්වා ඇති කරණු හේතුවෙන්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 වගන්තිය ප්‍රකාරව පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමට, අවශ්‍ය මූලාශ්‍ර සොයා ගැනීමට අපහසු වූ බව තවදුරටත් දන්වා සිටිමි.<br>එලෙසින්ම බෝර් හෝල් යන්ත්‍රය සහ එහි උපාංග මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි දී සමාගම විසින් ජාතික පුවත්පතක දැන්වීම පලකිරීමට අමතරව ආයතනයේ වෙබ් අඩවියේ ද දැන්වීම පල කිරීමට කටයුතු කරන ලද බව දන්වා සිටිමි. | **-එම-** |

**3.6** මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2021 ජුනි 11 දින වන විටත් සමාගම සතුව අනුමත කාර්ය මණ්ඩලයක් නොවුණු අතර ව්‍යාපෘති කාර්යාලය සහ වැඩබිම 29 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.** | ආයතනය විසින් මනම්පිටිය ව්‍යාපෘතියේ කාර්යභාරය පිළිබඳ වැඩ අධ්‍යයනයක් සිදු කර එක් එක් කාර්යය සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව හා තනතුරු ගණන තීරණය කරන ලදී. ඒ අනුව දැනට සේවකයින් 34 දෙනෙකු ව්‍යාපෘතියේ සේවය සඳහා යොදවා ඇත. එක් එක් සේවකයා වෙත පවරා ඇති කාර්යයන් සම්බන්ධව වැඩ විස්තරයක් ලබා දී ඇත. | **අනුමත කාර්ය මණ්ඩලයක් සකස් කර ගත යුතුය.** |

| | | | | |
|---|---|---|---|---|
| | | | එමෙන්ම මනම්පිටිය ව්‍යාපෘතියේ පැවරුම් පදනම මත සේවය කළ 2020-12-31 දිනෙන්, සේවා පැවරුම් අවසන් සේවකයන් 05 දෙනෙකුගේ සේවා කාලය 2021-01-01 දිනෙන් අවසන් කරන ලදී. | |
| (ආ) | (i) | **2018 වර්ෂයේදී සමාගමේ සේවයේ නියුතුව සිටි සේවකයන් 175 ට අමතරව තවත් තනතුරු 69 ක් යෝජනා කරමින් මුළු තනතුරු 224 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා තිබුණි. මෙම සමාගම සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති බැවින් ආයතනික කාර්ය මණ්ඩලය අනුමත කිරීමේ ඇති නෛතික හැකියාව පිළිබඳ සොයා බලා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව 2019 සැප්තැම්බර් 06 දිනැති ලිපියෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුම් දී ඇතත් 2021 ජුනි 11 දින වන විටත් නිශ්චිත තීරණයක් සමාගම වෙත දන්වා නොතිබුණි.** | ජාතික විගණන ආයතනය විසින් නිකුත් කල විගණන විමසුම් මගින් පෙන්වා දුන් කරුණු මත පදනම්ව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරන ලද අතර, ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවට සමාගම සම්බන්ධයෙන් ඇති නෛතික හැකියාව පිළිබඳ සොයා බැලිය යුතුබව දන්වා සිටින ලද අතර, එහිදී ලද උපදෙස් ප්‍රකාරව මනා දැනුමක් ඇති උපදේශකවරයෙකුගේ සේවය ලබා ගන්නා ලදි. එම උපදේශකවරයා සහ කළමණාකරුවන් සමඟ පැවැත්වූ සාකච්ඡාවේ දී සමාගමෙහි වර්තමාන ක්‍රියාකාරීත්වය සඳහා සහ ඉදිරි ව්‍යාපාරික අවස්ථාවන් පුරෝකථනය කර එම කටයුතු සඳහා 224 දෙනෙකුගෙන් යුත් සේවක මණ්ඩලයක් අවශ්‍ය වනු ඇතැයි හඳුනා ගන්නා ලදි. මේ පිළිබඳ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ ක්‍රියාවලිය පූර්ණ වශයෙන් අවසන්වී නොමැති බැවින් මෙම සේවකයින් ස්ථිර කිරීමේ ගැටලුවට විකල්පයක් ලෙස වත්මන් ව්‍යාපාරික කටයුතු අකර්මන්‍ය නොවී පවත්වාගෙන යාමට අවශ්‍ය අවම සේවක සංඛ්‍යාව 62 දෙනෙකුගෙන් යුත් සැලැස්මක් දක්වා පහල දමන ලදි එම කාර්ය මණ්ඩලය අනුමත කරගැනීම සඳහා අවශ්‍ය කැබිනට් පත්‍රිකාවක් මේ වනවිට පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | **කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය .** |
| | (ii) | **සමාගමේ අභ්‍යන්තර විගණන සහකාර තනතුරට බඳවාගෙන තිබූ පුද්ගලයෙකු 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව රේඛීය අමාත්‍යාංශයේ** | අභ්‍යන්තර විගණන අංශයේ සේවයේ නියුතු විගණන සහකාරවරයා කළමණාකාර සහකාර ගණයේ සිටි නිසා අභ්‍යන්තර විගණකවරයෙකු ආයතනයේ නොමැති හෙයින් අදාල විගණන සහකාරවරයාට සෘජුවම වගකීම් පැවරීමට එවකට නොහැකි විය. අමාත්‍යාංශය සමඟ අප ආයතනයේ ව්‍යාපෘති කටයුතු පසුවිපරම් කිරීම හා මාධ්‍ය කටයුතු සිදු කිරීම සඳහා සහ ආයතනයේ සුභසිද්ධිය උදෙසා විගණන සහකාරවරයා තාවකාලිකව පරිසර අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත. | **චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය .** |

| | | | |
|---|---|---|---|
| | **අමාත්‍යවරයාගේ කාර්යාලයට 2020 සැප්තැම්බර් 10 දින සිට මුදා හැර සමාගම විසින් රු.148,040 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. සමාගමේ සහකාර ගණකාධිකාරිනිය 2020 දෙසැම්බර් 02 දින සිට විධිමත් පරිපාටියකින් තොරව අභ්‍යන්තර විගණන නිලධාරී ලෙස පත්කර තිබුණි. තවද, පුරප්පාඩු වී ඇති, සහකාර ගණකාධිකාරි තනතුර 2021 ජුනි 11 දින වන විටත් පිරවීමට කටයුතු කර නොතිබුණි.** | එසේම ආයතනයේ විගණන කටයුතු සම්බන්ධව නිසි දැනුමක් හා පලපුරුද්දක් ඇති එකම නිළධාරිනිය හිටපු සහකාර ගණකාධිකාරීවරිය වන බැවින් වර්තමානයේ පැන නැගී ඇති විගණන කටයුතු සඳහා අභ්‍යන්තර විගණන නිළධාරී ලෙස පත් කෙරිනි. | |
| (iii) | **සමාගමේ ගණකාධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමට පැවති පරීක්ෂණයේ ලකුණු ලබාදීමේදී, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සහභාගී නොවූ සාමාජිකයෙකු ලකුණු ලබාදීම, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සිටි සාමාජිකයෙකු ඇගයීම් පත්‍රය සඳහා ලකුණු ලබා නොදී අවසන් ලකුණු සටහනට පමණක් අත්සන් තබා තිබීම, පැන්සලෙන් ලකුණු දමා පසුව පෑනෙන් ලකුණු දැමීම සහ ලකුණු වෙනස් කර තිබීම් යනාදිය සිදුවී තිබීම හේතුවෙන් අවිධිමත් ලෙස සම්මුඛ පරීක්ෂණය පවත්වා මෙම තනතුර සඳහා බඳවාගෙන තිබුණි.** | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා නම් කර තිබූ මානව සම්පත් උපදේශිකා රානි ගුණරත්න මහත්මිය හට එදින හදිසි රාජකාරි කටයුත්තක් යෙදුන අතර, ඇය වෙනුවට අප සමාගමේ මානව සම්පත් කළමණාකාරිනිය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නියෝජනය කරන ලදී. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියළු සාමාජිකයන්ගේ එකඟතාව මත ලකුණු සටහන් කර ඇති අතර ගණකාධිකාරි ලෙස තෝරා ඇති අයදුම්කාරිනියගේ පලපුරුද්ද හා සුදුසුකම් මත පදනම්ව ලකුණු ලබාදී ඇත.<br><br>විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ලකුණු සටහන් පත්‍ර සඳහා පෑනක් සහ පැන්සලක් භාවිතා වීම හේතුවෙන් යම් අවිධිමත්භාවයක් විගණනය විසින් නිරීක්ෂණය කල ද, සාධාරණ හා විනිවිදභාවයකින් ඉහත සම්මුඛ පරීක්ෂණය සිදු වී තිබුණි. ඉදිරියට ආයතනය විසින් පවත්වන ලද සියලුම සම්මුඛ පරීක්ෂණ අඩුපාඩු මඟහරවා ගනිමින් ඉතාමත් විධිමත්ව පවත්වා ඇත. | **නීතිරීතිවලට යටත්ව විධිමත්ව කටයුතු කල යුතුය.** |